කින්නියා නගර සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 01 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 අහිතකර මතය
------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ කරුණුවල වැදගත්කම හේතුකොට ගෙන 2017 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බැව් මා දරන්නාවූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

සභාව මුදල් හා උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එනමුත් වර්ගීකරණ සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ දෝෂ
---------------------

පහත සඳහන් ගිණුම්කරණ දෝෂ නිරීක්ෂණය විය.

(අ) ලෙජර, ද්විත්ව සටහන් පරිපාටි නොමැතිකම ආදිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. 2016 දෙසැම්බර් 31 දිනට වූ ශේෂපත්‍රයේ දැක්වෙන ශේෂ 2017 ජනවාරි 01 දිනට වූ ශේෂපත්‍රයේ දැක්වෙන ශේෂවලට වෙනස් විය. විස්තර පහත දැක්වේ.

| | ශේෂපත්‍රය අනුව ශේෂය | |
|---|---|---|
| විස්තරය | 2016 දෙසැම්බර් 31 | 2017 ජනවාරි 01 |
| ණය ගැතියන් | (3,016,367) | 293,909 |
| ටෙන්ඩර් තැන්පතු | 3,554,049 | 4,546,696 |
| පුස්තකාල තැන්පතු | 27,100 | 27,350 |
| විවිධ තැන්පතු | 70,145 | 33,495 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 224,720 | 497,629 |

| විස්තර | 2017 දෙසැම්බර් 31 | සටහන |
| --- | --- | --- |
| | (රු) | |
| මුද්දර ගාස්තු | 3,194,320 | පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු.5,740,020 ක්වූ ආරම්භක ශේෂය පෙන්වා නොතිබුණි. එසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන ශේෂයෙහි මෙය ඇතුළත් විය. |
| උසාවි දඩ මුදල් | 8,510,774 | පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු.6,707,724 ක්වූ ආරම්භක ශේෂය පෙන්වා නොතිබුණි. එසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන ශේෂයෙහි මෙය ඇතුළත් විය |
| මුදල් ශේෂය (පුරනැගුම) | 786,535 | මුදල් පොතේ ශේෂය වශයෙන් ශුන්‍ය අගයක් පෙන්වා තිබුණි. |

(ආ) පුරනැගුම වැඩසටහන යටතේ 2015 වර්ෂයතුළදී රු.6,161,693 ක පිරිවැයකට සංචාරක නිකේතනයක් ඉදිකර තිබුණි. මෙය නොනිමි වැඩ යටතේ පෙන්වා තිබුණි. එනිසා ජංගම නොවන වත්කම් සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂය තුළදී සංචාරක නිකේතනයේ භාවිතය සඳහා රු.6,707,967 කට මිලට ගත් ලී බඩු රු.1,575,992 ක් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දැක්වීම හේතුකොට ගෙන රු.131,975 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ටෙන්ඩර් තැන්පතු රු.2,294,099 ක් පුස්තකාල තැන්පතු රු.4,500 ක් සහ අනෙකුත් තැන්පතු රු.11,380 ක් වශයෙන් සැඳුම්ලත් රු.2,309,680 ක් 2016 වර්ෂයේදී ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමුච්චිත අරමුදල සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ඉඩම්, ගොඩනැගිලි සහ යන්ත්‍රාගාර සහ යන්ත්‍ර වටිනාකම වූ රු.22,255,930 ක් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට සටහන් නොකිරීම හේතුකොට ගෙන මෙම ගිණුම සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 වර්ෂය සඳහා ශුද්ධ ලාභය වූ රු.2,254,021 ක මුදල සම්මුචිත අරමුදලට ඇතුළත් කර නොතිබුණි. එම නිසා සමුච්චිත අරමුදල සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) මුදල් පොත අනුව 2017 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය රු.880,473 ක් විය. එසේවුවත් මූල්‍ය ප්‍රකාශනවල මෙය රු.903,715 ක් වශයෙන් දැක්වීම නිසා රු.23,242 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) ලෙජරයට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයකළ යුතු තක්සේරු බද්ද රු.389,268 ක් වුවත්, ආදායම් සහ වියදම් ගිණුමෙහි මෙය රු.848,505 ක් වශයෙන් දැක්වීම නිසා ආදායම රු.459,237 කින් වැඩිවීමකට හේතු විය.

1.3.3 නොසැඳු පාලන ගිණුම්

-----------------------

උප ලේඛනවල රු.23,296,722 ක් වශයෙන් දැක්වුණු ගිණුම් 04 ක එකතුව මූල්‍ය ප්‍රකාශන අනුව රු.22,673,255 ක් වශයෙන් දැක්විණි.එහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි ශේෂය රු.623,497 ක් අඩුවෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛන අනුව ශේෂය | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු හිඟ මුදල් | 1,579,107 | 1,975,716 | (396,609) |
| කුලී හිඟ මුදල් | 9,501,606 | 11,114,970 | (1,613,364) |
| සේවක ණය | 4,215,395 | 4,115,322 | 100,073 |
| ටෙන්ඩර් තැන්පතු | 7,377,117 | 6,090,714 | 1,286,403 |
| | 22,673,225 | 23,296,722 | (623,497) |

1.3.4 අවිනිශ්චිත ගිණුම

-------------------

අවිනිශ්චිත ගිණුමෙහි දිගින් දිගටම රු.29,358,517 ක බැර ශේෂයක් පෙන්නුම් කෙරිණි. මේ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

-----------------------------------------

ප්‍රතිපූර්ණ සංචිතය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.2,708,694 ක් විය. එසේවුවද, ශේෂය තහවුරු කිරීම සඳහා වූ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත පරිච්ඡේදය - 255 | මහජනයාගේ දැනගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශයක් රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතුවේ. එසේවුවද, 2018 අගෝස්තු 29 දක්වා එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | වර්ෂ 2 ඉක්මවූ රු.515,999 ක තැන්පතු ආදායමට බැර කිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

### 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,948,827 ක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්ථන වියදම රු.1,331,526 ක් විය.

### 2.2 **ආදායම් පරිපාලනය**

#### 2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,626 | 1,178 | 411 | 1,579 | 3,500 | 1,145 | 1,455 | 1,273 |
| කුලී | 10,706 | 12,610 | 6,812 | 9,501 | 8,471 | 6,569 | 6,571 | 10,585 |
| බලපත්‍ර ගාස්තු | 2,605 | 2,783 | 2,783 | - | 2,111 | 2,508 | 2,557 | - |
| වෙනත් ආදායම් | 3,970 | 6,574 | 2,850 | 11,705 | 3,720 | 3,273 | 719 | - |

#### 2.2.2 වරිපනම් හා බදු

නගර සභා අඥා පනතේ (255 පරිච්ඡේදය 160 වගන්තිය ප්‍රකාරව, ඉඩම්, ඉදිකළ නිවාස සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාල පරිච්ඡේදය සඳහා එකතුව රු.1,975,716 ක් වූ හිඟ වරිපනම් හා බදු අයකර ගෙන නොතිබුණි.

#### 2.2.3 ආදායම් පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාළු වෙළඳ පොළ බදු දීම

වසර 2008 සිට 2017 දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.6,636,250 ක්වූ හිඟ බදු කුලි අයකර ගැනීම සඳහා නගර සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ගවමස් කඩ බදු දීම

වසර 2007 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.2,781,727 ක්වූ හිඟ බදු කුලි අයකර ගැනීම සඳහා නගර සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සති අන්ත පොළ, කුකුල් කඩය සහ කරවල කඩය

සති අන්ත පොළ, කුකුල් කඩය සහ කරවල කඩය සඳහා වසර 2009 සිට 2018 දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.425,568 ක්වූ හිඟ බදු කුලි අයකර ගැනීම සඳහා නගර සභාව කටයුතු කර නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2006 ජූනි සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලපරිච්ඡේදය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) පාරිසරික ගැටළු

සභා බල ප්‍රදේශය යටතට වැටෙන කරෙයිච්චි ප්‍රදේශය අවට මහජනයා විසින් බැහැර කෙරෙන කසළ හේතුකොට ගෙන පාරිසරික ගැටළු සිදුව තිබුණි. ප්‍රදේශය පිරිසිදු කිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක

එක්සත් ජාතීන්ගේ රටවල ප්‍රධානීන්ගේ සමුළුවේදී තීරණය කළ පරිදි 2030 තිරසාර සංවර්ධන වැඩසටහන පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක පීපී-එල්එල් දරන ටිපර් රථය 2017 දෙසැම්බර් 14 දින අනතුරකට පත්ව තිබුණි. පාඩුව සහ ඊට වගකිව යුත්තන් හඳුනාගැනීම සඳහා විමර්ශන සිදුකර නොතිබුණි. විගණිත දිනය වූ 2018 අගෝස්තු 29 දක්වාම වාහනය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ ඡන්ද කොට්ඨාශ 7 න් කොට්ඨාශ 5 ක් තුළ වූ දේපළ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2002 වසරේදී තක්සේරු කර තිබුණි. එසේවුවද, 1999 වසරේදී සිදුකළ තක්සේරු පදනමට තක්සේරු වරිපනම් බදු දිගින් දිගට අයකරමින් පැවතුණි. කොට්ඨාශ 02 ක දේපළ තක්සේරු කිරීම මේ දක්වාම සිදුකර නොතිබුණි.

(ඇ) කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනය 2008 වර්ෂයේදී සභාවට පරිත්‍යාග කළ මහන මැෂින් 26 න් මැෂින් 22 ක් ක්‍රියා විරහිතව තිබුණි. ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පසුගිය වසර 07 ක් පුරාම පවතින ගණකාධිකාරී තනතුරේ ඇබෑර්තුව පිරවීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

3.4.1 වත්කම් ලියාපදිංචි කිරීම

--------------------------

වෙනත් ආයතන විසින් සභාවට පරිත්‍යාග කළ වාහන 17 ක් සභාව භාවිතා කරයි. එසේවුවත් එම වාහනවල අයිතිය ලබාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.4.2 වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය

------------------------------

2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඉදිරිපත් නොකළ කින්නියා මහජන පුස්තකාලයේ පොත් 1744 ක් අලන්කරනී මහජන පුස්තකාලයේ පොත් 574 ක් සහ මකුරුප් මහජන පුස්තකාලයේ පොත් 08 ක් වශයෙන් පොත් 2326 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි.

3.5 අනාර්ථික ගනුදෙනු

----------------------

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 චක්‍රලේඛයේ 4.1 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනවල අනියම් සහ තාවකාලික සේවකයන් සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් සිදුකළ යුතුය. එසේවුවත් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙනුවට, සේවක භාර අරමුදලට දායක මුදල් සිදුකර තිබුණි. 2012 ජනවාරි සිට 2015 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ සේවකභාර අරමුදල් දාකවීම් සහ 2014 මාර්තු සිට 2015 පෙබරවාරි කාලපරිච්ඡේදය සඳහා වූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් දායකවීම් නියමිත දිනවලදී සිදුකර නොතිබුණි. එනිසා අධිභාර වශයෙන් රු.482,710 ක මුදලක් ගෙවා තිබුණි.

3.6 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු ප්‍රකාරව සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

--------------------------------

4.1 අයවැය පාලනය

----------------

ඇස්තමේන්තුගත හා තත්‍ය අයවැය අතර සියයට 15 සිට 28 දක්වා පරාශවල විචලනයන් පෙන්නුම් කරන ලදී. ඵලදායි පාලන කාරකයන් වශයෙන් අයවැය උපයෝගී කරගෙන නොතිබුණි. තවද, දේපළවලින් ආදායම් වශයෙන් තක්සේරු කළ ආදායම රු.389,268 ක් ලෙස ඇස්තමේන්තුකර තිබූ නමුත් අයවැයට ඇතුළත් කළ මුදල රු.3,000,000 ක් විය.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

| පද්ධති හා පාලන | | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| ------------------ | | -------------------------- |
| (අ) | ගිණුම්කරණය | i. යාවත්කාලීන කළ ලෙජර් නඩත්තු කිරීම<br>ii. වියදම් අනුව වත්කම් වර්ගීකරණය<br>iii. ප්‍රධාන ලෙජරය නඩත්තු කිරීම |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීම |
| (ඇ) | ආදායම් පාලනය | හිඟ ආදායම් එකතු කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. |